

# මගේ ලෝකය

*There is only one happiness in this life, to love and be loved. ..*

## ඔහු සමණළයකු සේ සැහැල්ලුය

මේ තරුණයා නිසා මට ප්‍රතිපත්තියක් කඩන්නට සිදුවී තිබේ. ඒ ගැන කණගාටුවක් නැත.

මාර්තු තිස් වනදා රාත්‍රියේ රිවර්ගම් ශාලාවේ සිට ආපසු නිවසට එන පැය එකහමාරක් වන දිග ගමනේදී මගේ සිතේ තිබුණේ එකම එක කල්පනාවකි. මේ උද්‍යෝගිමත් ප්‍රාසාංගිකයා පිළිබඳව නොලියා සිටින්නේ කෙසේද යන්නයි. ඉතින් ප්‍රතිපත්ති කඩා බිඳ දමා ලියන්නෙමි.

ධනුෂ්ක ප්‍රභාත් මට මුහුණට මුහුණ හමුවන්නේ අහම්බයකිනි. අපි - කැලුම් පාලිත මහීරත්න මෙල්බනයට නිවාඩුවකට ආ වේලාවක - ටෙලි චිත්‍රපටයක් කරන්නට සැළසුම් කළෙමු. දක්ෂ ලේඛිකාවක වූ සොයුරියක් තිර පිපටත ලියූ අතර අපට අවශ්‍ය වූ දගකාර තරුණයාගේ චරිතය රගපාන්නට යෝජනා වූයේ ඔහුගේ නමයි. මම ඔහුට කතා කළෙමි. ඔහු එකඟ විය. දර්ශන ගණනාවක්ම රූපගත කෙරුණි. ඒ සැහැල්ලු රඟපෑම අපූරු යයි අධ්‍යක්ෂණය කළ කැලුම් මට කීවේ ය. එහෙත් ඒ ව්‍යාපෘතිය අවසානයක් කරා ගෙනයන්නට අපට නොහැකි විය.

ඔහු අති දක්ෂ වාදකයකු බව මම දැන සිටියෙමි. රඟපාන්නට අපේ නිවසට ආ විට ඔහු යන්තම් වාදකයකු වූ මගේ ගිටාරය අතට ගෙන සියුම් වාදනයක් කරනු මම අසා සිටියෙමි. "මේ ඈම්ප් එක හොඳ නැහැ අයියෙ" ඔහු මට කීවේ ය. සංගීතය පිළිබඳ ඔහුගේ දැණුම තේරුම් ගැනීමට අපහසු නැත.

"අයිය මාව නොදන්නා කාලෙත් මාව දිරිගන්වලා තියෙනවා" ඔහු වතාවක් කීවේ ය. එදා ඔහු ඒ කතාව එතැනින් නැවතා දැම්මේ මගේ සිතේ කුතුහලයක් ඉතිරි කරමින් ය. මා මගේ ජීවිතයේදී නාඳුණන බොහෝ දෙනෙක් දිරි ගන්වා ඇත්තෙමි. ඒ අතර ධනුෂ්ක සිටියේ කොතැනද?

තැනින් තැන ප්‍රිය සාද වලදී ඔහු වාදනය කරනු මම අසා සිට ඇත්තෙමි. රස විඳ ඇත්තෙමි. ඒ සෑම තැනකදීම වෙනත් ප්‍රාසාංගිකයන් වෙන නොතිබුණ වෙනස් යමක් මම ඔහු වෙතින් දුටුවෙමි. ඒ වෙනස කුමක්දැයි මා නිවැරදිව වටහා ගත්තේ මාර්තු 30 වන දා රිවර්ගම් ශාලාවේදී ය. එදා ඔහු සිය තාරුණ්‍යයේ ප්‍රහර්ශයෙන් ඒ ශාලාව පුපුරවා හැරියේ ය.

ඔහු සාමාන්‍ය පෙළට ඒ සාමාර්ථ අටකුත් උසස් පෙළට ඒ සාමාර්ථ හතරකුත් ගත් හැටි රස කර කීවේ අප මිත්‍ර නිවේදක සහන් වීරසේකර ය. එය බොහෝ දෙනෙකුට



Photo - Sanka D

අලුත් ප්‍රවෘත්තියක් වූවා නිසැක ය. සංගීතයෙහි ගායනයෙහි මේ සා සමත්කම් දක්වන මේ තරුණයා ශක්තිමත් පදනමක දෙපා තබා ගත්තකු බව සහන් ගේ හෙළිදරව්ව අපට පෙන්වා දෙයි.

මම අවුරුදු විස්සකට වැඩි කාලයක් තිස්සේ මේ මෙල්බන් නගරයේ ශ්‍රී ලංකේය සමාජයේ විවිධාකාර වූ ප්‍රසංග අපමණ සංඛ්‍යාවක් නරඹා ඇත්තෙමි. අප ජීවත් වන මේ නගරයේ අපේ ප්‍රජාවේ සිටින අති විශාල සංඛ්‍යාවක් වූ දක්ෂ කලාකරුවන්ගේ කලාකාරියන්ගේ නිර්මාණ රස විඳ ඇත්තෙමි. අගය කර ඇත්තෙමි. ඒවාට ප්‍රශංසා කර ඇත්තෙමි. ඔවුන් දිරි ගන්වා ඇත්තෙමි. ඔවුන් ඉදිරියට යන ආකාරය සතුටින් බලා සිට ඇත්තෙමි. ඒ සියල්ල අතරේ ධනුෂ්ක ප්‍රභාත් නම් වන තරුණයා මගේ සිතේ නොමැකෙණ ප්‍රාසංගික අත්දැකීමක් ඉදිරිපත් කිරීම මට මහත් සතුටකි.

"ධනුෂ්ක ලංකාවේ හිටියා නම් හුඟක් දුර යනවාමයි" සල්මලීවාහනය පදවන මගේ දැහැන බිඳ දමමින් කියයි. මම ද එය අනුමත කරමි. එහෙත් ඔහු කියන්නේ වෙනත්ම කතාවකි.

"මං මේ මෙල්බන් සමාජයට හරි ආදරෙයි අයියෙ.. මේ මිනිස්සුත් මට හරිම ආදරෙයි. ඒක මට දැනෙනවා.. මේ බලන්න. මං වගේ අලුත් ශිල්පියෙක් කරන පළමු ප්‍රසංගයට මේ තරම් සෙනගක් ආවෙ ඇයි කියල හිතන්න.. මේ ආදරේ මට දැනෙනවා.. මං කැමතියි කොහෙවත් නොයා මේ මට ආදරේ කරන අයට සින්දු කියන්න" ඔහු කියන්නේ ඇත්තකි. මේ සමාජය ඔහුට කොයි තරම් ආදරය කරන්නේද යන්න එදා ඒ ප්‍රසංගයට නරඹන්නට ආ අයට වැටහෙන්නට ඇති බව නිසැක ය.

ඔහු ගීත ඉදිරිපත් කරන්නේ බොහෝ සැහැල්ලුවෙනි. ගීත ඉදිරිපත් කිරීමේ දී ඒ ගීත වල සැඟවුණ රසය ඔහුද විඳගන්නා බව අපට පෙනෙයි.

"මට දැනෙන්නැති සින්දු කියන්න මට බැහැ.. මම සින්දු කියන්නෙ ඒවා මගේ ඇඟටම අරගෙන.. ඒවා එක්ක බද්ධ වෙලා" ඔහු කියන කතාව පැහැදිළි ය. ඔහු ඒ ගී හා සමවැදී සිටින ආකාරය අපට පෙනෙයි. ඒ අපූර්ව ප්‍රාසාංගිකත්වයට මම කැමැත්තෙමි. ඒ තාරුණ්‍යයේ ජවයට මම කැමැත්තෙමි. එය බලා සිටීමම සතුටකි. ජෝතිපාලගේ ග්‍රේෂන් ආනන්දගේ රූකාන්තගේ ගී ඉදිරිපත් කිරීමේදී ඔහු පෑ හැකියාව අපූරු ය. ඒ හැකියාව ඇති ගායකයන් විරළ ය.

ධනුෂ්ක වාසනාවන්තයෙකි. නාලක අංජන කුමාර මහින්ද බණ්ඩාර ඉන්ද්‍රජිත් මිරිහාන කැමරන් කොළඹගේ වැනි ප්‍රවීණයන් ඔහු හා එක්වීමත් ඈෂ් සමග ඩයිනමික්ස් වැනි තරුණයන් ඔහු වට කර ගැනීමත් අනෙක් දක්ෂ වාදක පිරිස ඔහු ගේ ප්‍රසංගය රස ගුලාවක් කිරීමත් අපට පුදුමයක් නොවන්නේ එනිසා ය.

"මං මේ ප්‍රවීණයන්ට හරියට ගරු කරනවා අයියෙ" ඔහු කියයි. ඒ හැදෙන මිනිසෙකුගේ ඉදිරියට යන මිනිසකුගේ ලක්ෂණයකි. "මේ හැම දෙනාම මගේ වටේ හිටිය නිසා තමයි මට මේ ගමන එන්න පුලුවන් වුණේ"

ඒ හැම දෙනා අතර අපූරු නර්තනයෙන් ප්‍රසංගය සැරසූ ශිල්පිණියන් ශිල්පීන් වෙන් කළ නොහැකි ය. ඒ නර්තනාංග ප්‍රසංගය හා මනා සේ බද්ධ වූවා යයි අපට සිතෙයි. එකකට එකක් පරදින්නේ නැති ඒ නර්තන අතර මිනෝලි දේවගේ ඉදිරිපත් කළ සැහැල්ලු නර්තනය තවමත් මගේ සිතේ ඇඳෙයි.

මේ සටහන ලියන අතර මගේ දුරකතනය නාද වෙයි. ඒ ධනුෂ්ක ගේ අංකයයි.

"මගේ ෂෝ එක බලන්න ආවට ස්තුතියි අයියෙ.." ඔහු කියයි. "ඔයා මගේ ඕඩියන්ස් එකේ ඉන්නව දැක්කම මට පුදුම සතුටක් ඇති වුණේ.. මෙයිට අවුරුදු ගාණකට කලින් ඔයා මාව නොදන්නා කාලෙ මං පළමු වතාවට හම් කරලා සින්දුවක් ෆේස් බුක් එකට දැම්මම ඒකට ප්‍රශංසා කරලා ඔයා දාපු කොමෙන්ට එක තමයි ෆේස් බුක් එකේ මට වැටිච්ච පළමු කොමෙන්ට් එක.. එදා වැටිච්ච එකම කොමෙන්ට් එකත් ඒකමයි.. අද මං ෆේස් බුක් එකට සින්දුවක් දැම්මම සිය ගාණක් කොමෙන්ට්ස් වැටෙනවා.. ඒත් එදා ඔයා දාපු කොමෙන්ට් එකට මං අදත් ගරු කරනවා"

ඉතින් දැන් මගේ ඇස් වලට නැගුණ සතුටු කඳුළ පිසදා ගන්නා වේලාවයි.

ජගත් ජේ එදිරිසිංහ

